* ලෝහවල රසායනික සංයුතිය (chemical analysis ) පරීක්ෂාව
* ලෝහවල දවනාවය ( hardnen test ) පරීක්ෂාව
* ලෝහවල ආතන්‍ය බලය (tensile test) පරීක්ෂාව
* ලෝහවල ව්‍යුහ ( microstructure test ) පරීක්ෂාව
* කර්මාන්ත පරීක්ෂාකර ගැටළු සඳහා උපදේශක සේවා සැපයීම
* නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා උපදේශක සේවා
* කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණ වැඩමුළු/ සම්මන්ත්‍රණ පැවැත්වීම
* කාර්යාලයට පැමිණෙන කර්මාන්තකරුවන් සඳහා උපදෙස් සැපයීම.
* වාත්තු තාක්ෂණ පුහුණු පාඨමාලා ( දින 10 හෝ දින 15 වැඩ සටහන ) පැවැත්වීම.
* වාත්තු මල් තාක්ෂණය ( Pattern Making )
* වාත්තු පස් සැකසීම හා වාත්තු පස් අච්චු සැකසීමේ තාක්ෂණය ( Moulding Sand and Moulding )
* ලෝහ උණු කිරීමේ තාක්ෂණය ( Melting )
* අවශ්‍යතා මත කර්මාන්තකරුවන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම.
* ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ඉංජිනේරුවන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.

*22 පිටුවෙන්...*

වුවද වෙළඳ ලකුණ වලංගු වන දිනය ලෙස සැලකෙන්නේ අයදුම්පත ගාස්තුවක් සමග බුද්ධිමය දේපල කාර්යාලයට ඉදිරිපත් කළ දිනයයි. අයදුම් කළ දිනයේ සිට වසර දහයක් දක්වා ලියාපදිංචි ලකුණක් වලංගුවන අතර, අලුත් කිරීමේ ගාස්තුවක් සෑම අවුරුදු දහයකට වරක්ම ගෙවීමෙන් ලියාපදිංචිය අලුත් කරවා ගත හැකිවේ.

### වෙළඳ ලකුණක ඇති වැදගත්කම

ලියාපදිංචි වූ වෙළඳ ලකුණක අයිතිකරුවකුගේ අවසරය නොමැතිව එම ලකුණු භාවිතා කිරීමට තුන්වන පාර්ශවයකට නොහැකිය. ව්‍යාපාරිකයෙකු තම ව්‍යාපාරය අන්සතු කිරීමකදී තමාගේ ලියාපදිංචි කළ වෙළඳ ලකුණට, එහි ඇති කීර්ති නාමය වෙනුවෙන් හොඳ මිලක් ලබාගත හැකි වනු ඇත. තවද තම ලියාපදිංචි ලකුණ යටතේ හොඳ තත්ත්වයෙන් යුතු භාණ්ඩයක් හෝ සේවාවක් සපයන්නේ නම් මහජනයා අතර, එම ලකුණ ප්‍රසිද්ධියට පත්වනු ඇත. ඒ අනුව එම ව්‍යාපාරයේ දීර්ඝ කාලීන දියුණුවක් ඇතිවනු ඇත.

භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා පමණක් නොව යම් ව්‍යාපාරිකයෙකුට තම ව්‍යවසායේ ව්‍යාපාර නාමය වුවද ඉහත ආකාරයටම ලකුණක් සේ ලියාපදිංචි කරගැනීමේ හැකියාව ඇත. එසේ කිරීමෙන් එම ව්‍යවසායට වැඩි වැදගත්කමක් ලැබෙනු ඇත.

## සුනාමියෙන් හානි වූ කර්මාන්ත සඳහා සහන සැලසීමේ වැඩසටහන

හානියට පත් කර්මාන්ත පිළිබඳ 2005 ජනවාරි මාසයේදී පැවැත්වූ සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කොට ගනිමින් තෝරාගත් ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා උපකරණ කට්ටල සහ අමුද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කොට තිබේ. කුඩා හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ අනුග්‍රහය මත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයවීමෙන් උපකරණ හා අමුද්‍රව්‍ය බෙදාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර, පළමු අදියර දී රු. 15,000/- ක් උපරිමයකට යටත්ව පහත ක්ෂේත්‍රයන් සඳහා උපකරණ කට්ටල ලබාදීම සිදුකෙරේ.

- ලණු ඇඹරුම් කර්මාන්තය
- ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදන සහ අළුත්වැඩියාව
- වඩු කර්මාන්තය
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- බේකරි හා රසකැවිලි නිෂ්පාදන
- ඇඟලුම් මැසීමේ ව්‍යාපාරය
- යතුරුපැදි අළුත්වැඩියාව
- පාපැදි අළුත්වැඩියාව
- ලොන්ඩ්රි

මේ වන විටත් මාතර, හම්බන්තොට, ගාල්ල සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා උපකරණ කට්ටල සහ අමුද්‍රව්‍ය සපයා අවසන්.

**"ගුරු පැහැයෙන් රන් පැහැයට"** කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ කළමනාකරණ 'අ' වැඩසටහන පහත සඳහන් ගම්මානයන්හි පවත්වන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | කම්මල් ගම්මානය | වැබඩ | ගම්පහ |
| 2. | සිමෙන්ති මල් පෝච්චි නිෂ්පාදනය | නෙලවල | මොරටුව |
| 3. | කම්මල් ගම්මානය | ඇපලාව | කෑගල්ල |
| 4. | ස්වර්ණාභරණ ගම්මානය | දෙල්දෙණිය | කෑගල්ල |
| 5. | මැටි ගම්මානය | බිල්ලපාන | කෑගල්ල |
| 6. | වේවැල් නිෂ්පාදන | රදාවඩුන්න | ගම්පහ |
| 7. | මැටි | රුක්මලේ | කුරුණෑගල |
| 8. | මැටි | උණලියිය | කුරුණෑගල |
| 9. | රබර් මෙට්ට | කහපොල | කොළඹ |